රත්තොට ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය

-----------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.1,048,584 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ආ) | වර්ෂයට අදාළ උසාවි දඩ ආදායම රු.469,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඇ) | අයවීමට නොමැති එකතුව රු.548,035 ක ශේෂ 5 ක් ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඈ) | වටිනාකම රු.259,850 ක් වූ ඉඩම් කට්ටි 4 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඉ) | පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.46,175 ක් වටිනාකමින් යුතු පිළිගැනීමේ කවුන්ටරය ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පරිත්‍යාග ලෙස ලැබී තිබූ ජල පෙරන 2 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (උ) | උඩහපුවිද කම්පිටිය මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට වැයකළ රු.100,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඌ) | රත්තොට නගර ශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ වටිනාකම රු.668,618 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (එ) | ක්‍රියාත්මක නොකළ රු.1,825,000 ක් වූ කර්මාන්ත 4 ක්වු ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඒ) | සභාවේ මන්ත්‍රීවරුන් සහ නිලධාරීන් වෙත පනවන ලද අධිභාරවලට අදාළව ලැබී තිබූ රු.867,265 ක මුදලක් ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඔ) | ගෙවිය යුතු බවට හඳුනා ගැනීමට නොහැකි රු.5,536,422 ක් ගබඩා ණයහිමියන් යටතේ දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ඕ) | කොන්ත්‍රාත් ලේඛනය හා ලිපිගොනු අනුව ගෙවීමට නොමැති රු.928,089 ක් කර්මාන්ත ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ක) | රත්තොට ගම්මඩුව පිටත මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ගෙවීම් කටයුතු අවසන් කර තිබියදී, රු.200,000 ක් ණය හිමියන් යටතේ දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. 2020 වර්ෂයේ දී නිවැරදි කරමි. |

1.3.2 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.121,877,636 ක් වූ ගිණුම් විෂයයන් 5 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂ අතර, රු.23,041,104 ක වෙනසක් විය. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

1.3.3 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1997 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනඑමින් පවතින රු.15,462 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ දෝෂය හඳුනාගෙන නිවැරදි කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ලැබිය යුතු ගිණුම් | | |
| | වර්ෂ 1 ට වැඩි හා 5 ට අඩු රු.10,895,574 ක ශේෂයන් හා වර්ෂ 5 ට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකළ රු.3,105,518 ක් වූ ලැබියයුතු ශේෂ පැවතුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | ගෙවිය යුතු ගිණුම් | | |
| | වර්ෂ 1 ට වැඩි හා වර්ෂ 5 ට අඩු රු.15,048,818 ක ශේෂයන් හා වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින රු.7,237,644 ක ගෙවිය යුතු ශේෂ පැවතුණි. | ණයහිමි ශේෂය නිරවුල් කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.63,891,876 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන හා සමීක්ෂණ වාර්තා පිළියෙල කර යාවත්කාලීන කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත, 24 වගන්තිය | - | සභාවට අයිති සියලුම මාර්ග ඇතුළත් කර ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | මං.මාවත්වල ලේඛනයක් නඩත්තු කළ යුතු වේ. | ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති, 218 රීතිය | - | සභාවේ ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | වත්කම් සමීක්ෂණය කඩිනමින් අවසන් කළ යුතු වේ. | 2017 වර්ෂයේ සිට වත්කම් සමීක්ෂණයක් සිදුකරමින් පවතී. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 571(3) | 116,294 | අවස්ථා 9 කට අදාළ මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මු.රෙ.571(අ) අනුව කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,240,576 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,204,547 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,300,000 | 1,402,688 | 827,020 | 1,686,002 | 1,355,152 | 1,381,466 | 1,696,965 | 1,219,752 |
| (ii) | කඩ කුලී | 2,706,520 | 2,801,718 | 2,357,577 | 1,846,897 | 3,024,580 | 2,646,529 | 2,646,529 | 1,402,757 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 900,000 | 648,436 | 648,436 | - | 750,000 | 902,625 | 902,625 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,169,494 | 7,792,027 | 6,927,984 | 9,024,950 | 20,264,358 | 8,150,147 | 12,400,595 | 8,170,707 |
| | එකතුව | 13,076,014 | 12,644,869 | 10,761,017 | 12,557,849 | 25,394,090 | 13,080,767 | 17,646,714 | 10,793,216 |

#### 2.2.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ 32 හා 42 වගන්තිවලට අනුව වරිපනම් හිඟ හිටි පුද්ගලයින්ගේ දේපල තහනම් කිරීම් සඳහා විනිශ්චය බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(i) වගන්තිය කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු කඩ කාමර 96 ක් සම්බන්ධ නව තක්සේරුවක් ලබාගෙන ගිවිසුම් අලුත් කර නොතිබුණි. | නව තක්සේරුවක් ලබාගෙන කඩ කාමර ගිවිසුම් අළුත් කළ යුතු වේ. | කඩ කාමර 91 ක් දැනට තක්සේරුකර ඇති අතර, ඉතිරි කඩ කාමර 5 තක්සේරු කිරීම සඳහා ඉල්ලීම් කර ඇත. |
| (ආ) | සභාවට අයත් කඩ කාමර 35 ක මුල් බදුකරුවන්, රු.25,000 සිට රු.6,000 දක්වා පරාසයක් තුළ කඩ අතුරු බදු දී තිබුණි. | පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | තොරතුරු සනාථ කර ගැනීම සඳහා මේ වන විට සමීක්ෂණයක් සිදුකර ඇත. |
| (ඇ) | රංජන් විජේරත්න මාවතේ අංක 03 දරන කඩ කාමරයේ මුල් බදුකරු මියගොස් තිබිය දී අතුරු බදුකරුට ව්‍යාපාර කටයුතු ඉටු කිරීමට ඉඩ හැර පසුව ඉන් ඉවත් කිරීමට සභාව කටයුතු කිරීමේදී අතුරු බදුකරු විසින් සභාවට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | නීත්‍යානුකූලව විසඳා ගත යුතු වේ. | අදාළ කඩ කාමරයේ අතුරු බදුකරුවෙකු නොසිටි අතර, සභාව විසින් නීත්‍යානුකූලව බදුදී තිබූ බදුකරුගේ සේවකයෙකු අතර පැවැති ආරවුලක් හේතුවෙන් මෙම නඩු නිමිත්ත පැනනැගී ඇත. |
| (ඈ) | පෙට්ටි කඩ සඳහා අයවිය යුතු කඩ කාමර කුලී රු.163,837 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

2.2.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2000 වර්ෂයට පෙර සිට පැවත එන හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.405,686 ක් විය. | ලැබිය යුතු බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

2.2.5 වෙනත් ආදායම්

(අ) ජල ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට රු.8,616,061 ක ජල ගාස්තු හිඟයක් පැවති අතර එම ජල හිඟය අයකර ගැනීමට ප්‍රමාණවත් පරිදි කටයුතු කර | අය කළ හැකි ජල ගාස්තු කඩිනමින් අයකර ගැනීමටත්, අයකරගත නොහැකි ශේෂයන් | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. මෙම ශේෂය තුළ 1998 සිට පැවතෙන රු.1,257,266 ක ශේෂයක් සහ තොරතුරු සොයාගත නොහැකි දැනට විසන්ධි කර ඇති ජල සම්බන්ධතාවලට අදාළ රු.1,659,161 ක ශේෂයක් ද පැවතුණි. | සම්බන්ධව නිසි පරීක්ෂණයක් කර සුදුස්සක් කිරීමට කටයුතු කළ යුතු වේ. | |
| (ii) | ජල ව්‍යාපෘති 8 ක බෙදාහරින ජලයේ ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීමක් සිදුකර නොතිබුණි. | ගුණාත්වයෙන් යුතු පිරිසිදු පානීය ජලය නිකුත් කළ යුතු වේ. | මේ වන විට ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |

(ආ) ත්‍රීරෝද රථ ගාස්තු
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බලප්‍රදේශයේ පවතින ත්‍රීරෝද රථ පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, නැවතුම් ස්ථාන හඳුන්වාදීමක් ද සිදුකර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ත්‍රී රෝද රථ නියාමනය කළ යුතු වේ. | නව අතුරු ව්‍යවස්ථාවක් දැනට කෙටුම්පත් කර ඇති අතර, ඒ අනුව සමීක්ෂණයක් ද මේ වන විට සිදුකර ඇත. |

(ඇ) වෙනත්
---------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කයිකාවල පෙල්ස්තා පතලෙන් පෙල්ස්තා ප්‍රවාහනය කිරීම වෙනුවෙන් අයවිය යුතු රු.582,800 ක ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථා 7 ක් පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි. |

(ආ) අත්හැර දැමූ කර්තව්‍යයන්

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.400,000 ක ඇස්තමේන්තුවක් මත සකස්කර තිබූ කම්කරුවන් සඳහා විවේකාගාරය ඉදිකිරීමේ කර්මාන්තය 2020 මැයි 20 දින වන විටත් ඉටුකර නොතිබුණි. | සැලසුම්ගත කරුණු අප්‍රමාදව ඉටු කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම පිළිබඳව සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | සැලසුමෙහි අඩුපාඩු හඳුනාගෙන ඉදිරියේදී විධිමත් පරිදි සැලසුම් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුරනැගුම ව්‍යාපෘතිය මගින් 2016 වර්ෂයේ රු.29,717,248 ක් වැයකර ඉදිකර තිබුණු පොල්වත්තාකන්ද ජල ව්‍යාපෘතිය 2017 ජූනි 30 දින අඩුපාඩු සහිතව සභාවට භාරදී තිබූ අතර, එහි අඩුපාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කිරීමකින් තොරව රු.1,485,862 ක් වටිනා සුරක්ෂිත ඇපය පළාත් පාලන කොමසාරිස්වරයා වෙත යවා තිබුණි. | අඩුපාඩු කඩිනමින් සකස් කරවා ගත යුතු වේ. | ඉදිරියේදී අඩුපාඩු සකස්කර ගැනීමට කටයුතු කරන අතර සුරක්ෂණ ඇපකරය ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ 3 ක් තුළ ගොඩනැඟිලි අයදුම්පත්‍ර 487 ක් ඉදිරිපත්වී ඉන් 364 ක් අනුමත වී තිබූ අතර, 41 දෙනෙකුට පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. | අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අවුරුදු 2 ඉක්මවා ඇති අනුමත ගොඩනැඟිලි සැළසුම් සඳහා ලිපි යොමු කිරීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 අගෝස්තු 31 දිනට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් පැවතුණි. | පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරමින් පවති. |
| (ආ) | සේවයේ යොදවාගෙන සිටින මාර්ග කම්කරුවන් 4 දෙනෙකු වෙනත් රාජකාරිවල යොදවා තිබුණි. | සේවකයින් නිත්‍ය රාජකාරිවල යෙදවීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පැවැතීම හේතුවෙන් මෙසේ යොදවා ගැනීමට සිදුව ඇත. |
| (ඇ) | දීර්ඝ කාලයක සිට පැවත එන සේවය හැරගිය හා මියගිය නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.53,457 ක ණය ශේෂයක් අයකරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වසර ගණනාවක සිට පවතින හිඟ ශේෂයන් සේවක ණය ලේඛනවලින් කපා හැරීමටත්, අනෙකුත් ණය අයකර ගැනීමටත් කටයුතු කරමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පරිහරණය කරන ගොඩනැගිලි 34 ක සහ සුසාන භූමි 22 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මැනීම් කටයුතු අවසන් වූ වහාම පවරා ගැනීමේ කටයුතු කරමි. |
| (ආ) | ඉඩම්වල අයිතිය පවරා නොගැනීම හේතුවෙන් අංකෙලි මැඩිල්ල හා කිවුල සුසාන භූමිවල අනවසර පදිංචිකරුවන් පදිංචි වී තිබූ අතර, දැනට සභාව සමඟ නඩු ක්‍රියාමාර්ගවලට ද එළඹ තිබුණි. අංකෙළිමැඩිල්ල ඉඩම සඳහා නීතිඥ ගාස්තු ලෙස රු.46,500 ක් වැය කර තිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කිවුල සුසාන භූමිය පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර, අංකෙළිමැඩිල්ල සුසාන භූමිය සම්බන්ධයෙන් නඩු ක්‍රියාමාර්ගයක් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1999 සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ විවිධ කටයුතු සඳහා ලබාදී තිබූ රු.174,687 ක වටිනාකමින් යුතු අත්තිකාරම් ශේෂ 11 ක් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.944,400 ක් වටිනා වාහන 7 ක් භාවිතයට ගත නොහැකිව නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවැතුණි. | අපහරණය කිරීමට කටයුතු කළ යුතු වේ. | නියමිත ක්‍රමවේදයට අනුව වාහන වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

### 3.5.2 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ කම්පැක්ටර් රථය කිලෝ මීටර 434 ක් ධාවනය කළ බවට ව්‍යාජ ලෙස ධාවන සටහන් දක්වා ඉන්ධන ලීටර් 296 ක් සඳහා රු.30,760 ක් අවභාවිතා කර තිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාළ මුදල රියදුරුගෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ටිපර් රථයේ මයිලෝ මීටරයට වඩා කිලෝ මීටර 2693 ක් වැඩියෙන් දක්වා ඉන්ධන ලීටර් 1077 ක් සඳහා රු.112,029 ක මුදලක් අවභාවිතා කර තිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මේ පිළිබඳව රියදුරු මහතාගෙන් කරුණු විමසා ඇති අතර, ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | ජල බවුසරයේ මයිලෝ මීටරයට වඩා කිලෝමීටර 5637 ක් දෛනික ධාවන සටහන්වල වැඩියෙන් දක්වා ඉන්ධන ලීටර් 2253 ක් සඳහා රු.234,416 ක මුදලක් අවභාවිතා කර තිබුණි. 2019 අප්‍රේල් 24 දින සිට 2019 ඔක්තෝබර් 06 දක්වා ලියා නොතිබූ ධාවන සටහන් සමඟ මෙම වටිනාකම තවදුරටත් ඉහල අගයක් බවට පත්විය හැකිය. | විධිමත් පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මෙම රථයේ මයිලෝ මීටරය 2018 වර්ෂයේ සිට අක්‍රියව පැවැති අතර, ධාවන සටහන් පමණක් ඉදිරියට සටහන් වන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාහන 04 ක් ධාවනයේ යෙදුනු බවට සහතික කිරීමකින් තොරව කිලෝමීටර 19391 ක් ධාවනය කිරීම් හා යන්ත්‍ර පැය 95 ක් භාවිතා කර ඒ වෙනුවෙන් ඉන්ධන ලීටර් 4225 ක් සඳහා රු.454,559 ක් වැයකර තිබුණි. | විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ධාවන සටහන් පවත්වාගෙන යාමට රියදුරු මහතුන් දැනුවත් කර ඇති බව දන්වා සිටිමි. |
| (ඉ) | තාක්ෂණ ඇගයීම් කමිටුව සහ ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශයට පටහැනිව කටයුතු කර 2019 දෙසැම්බර් මස 28 වන දින වෙනත් ආයතනයකින් අත්මිල ගණන් ලබාගෙන කැබ් රථයේ කැනපිය යෙදීමට රු.251,500 ක් වැයකර තිබුණි. | විධිමත් ක්‍රමවේදය අනුගමනය කළ යුතු වේ. | අත්මිල ගණන් ලබාගත් ආයතනයේ මිල ගණන් අවම නිසාත්, වගකීම් කාලය වැඩි නිසාත්, තත්ත්වයෙන් හා ප්‍රමිතියෙන් උසස් බැවින් එම ආයතනයෙන් අළුත්වැඩියාව සිදුකර ගැනුණි. |

## 3.6 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1)(xi) වගන්තිය ප්‍රකාරව විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ගිවිසුම්ගත නොවී රූඩ් 3 පර්චස් 37.5 ක ඉඩම, 1971 වර්ෂයේ සිට පොලිස් ස්ථානය සඳහා දීර්ඝ කාලීන බදු පදනමට ලබාදීමට අදාළව 2017 සිට 2019 වර්ෂය දක්වා අයවිය යුතු රු.171,100 ක හිඟ කුලියක් අයකරගෙන නොතිබුණි. | ගිවිසුම්වලට එළඹීමටත්, ගාස්තු අය කිරීමටත් කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ගිවිසුමක් සකස්කර අත්සන් කිරීම සඳහා යොමුකර ඇති අතර, කාල සීමාවට අදාළ කුලී ගෙවීම සිදු නොකිරීම පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුවට දන්වා ඇත. |

## 3.7 හඳුනාගත් අලාභ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| භාවිතයෙන් ඉවත් කර තිබූ වාහන 6 ක් විකිණීමට 2018 වර්ෂයේ මිල ගණන් කැඳවා ඉහල මිල ගණන් ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර්කරුවන් වෙත වාහන අලෙවි කිරීමට සැලසුම් කළත් මහා සභාව මෙම වාහන විකිණීම 2018.07.06 දින අතරමඟ නවතා තිබුණි. පසුව 2018 දෙසැම්බර් මාසයේදී වැඩිම මිල ගණන් ඉදිරිපත්කළ ටෙන්ඩර්කරුවන්ගෙන් විමසීම් කිරීමේදී එම | මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. මේ වන විට නියමිත ක්‍රමවේදයට අනුව වාහන වෙන්දේසි කිරීමට කටයුතු කරගෙන යමින් පවතී. |

ටෙන්ඩර්කරුවන් මිලදී ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. මේ හේතුවෙන් රු.1,278,000 කට අයදුම් කළ එක් වාහනයක් රු.786,000 ක මුදලකට අයදුම්කළ ටෙන්ඩර්කරුවෙකුට අලෙවි කිරීමෙන් රු.492,000 ක පාඩුවක් සිදුකර තිබුණි. ඉතිරි වාහන 5 ක් මේ දක්වා අලෙවි කිරීමට නොහැකිවී තිබුණි.

3.8 ප්‍රසම්පාදනය

---------------

කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------- | ----------------------------- |
| (අ) | වනරාණිය ෆවුසි මාවත සංවර්ධනය කිරීම - රු.447,640<br>------------------------------------------ | | |
| (i) | සභාවේ තාක්ෂණික නිලධාරියෙකුගේ අධීක්ෂණයකින් තොරව කානු සඳහා කොන්ක්‍රීට් යොදා තිබුණි. | කොන්ත්‍රාත්කාර සමිතිය අසාදු ලේඛනගත කළ යුතු වේ. | අධීක්ෂණයකින් තොරව සමිතිය විසින් ඉදිකිරීම් කර ඇත. |
| (ii) | ඉදිකර තිබූ කානුවේ පතුල අඩි 16 ක් පමණ දුරකට සේදී ගොස් තිබූ අතර, එම ස්ථානවලට වැරගැන්නුම් කම්බි යොදා නොතිබුණි. කොන්ක්‍රීට් කානුවෙහි පතුල අඟල් 6 ක් ලෙස ඉදිකළ යුතු වුවත්, එහි ඝනකම අඟල් 3 ½ ක් වී තිබුණි. | නිසි අධීක්ෂණයකින් යුතුව වැඩ ඉටු කරවා ගත යුතු වේ. | එම කොටස සඳහා අදාළ තාක්ෂණ නිලධාරි විසින් ගෙවීම් කටයුතු කිරීමට නිර්දේශ කර නොමැති අතර, ගෙවීම් කර නොමැති බවද දන්වමි. |
| (ආ) | රත්තොට පැපොලයාය මාර්ගය ප්‍රතිසංස්කරණය - රු.1,000,000<br>-------------------------------------- | | |
| (i) | කොන්ක්‍රීට් මාර්ග තලයේ දකුණු පස ජලය බැසයාම පාලනය කිරීමට 156’ x 2’-5" x 0-6 " ප්‍රමාණයෙන් ඉදිකර තිබුණු ආරක්ෂිත බැම්ම ස්ථාන කිහිපයක් කඩා පරීක්ෂා කිරීමේදී එය පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දුර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයන් යොදා ඉදිකර තිබුණි. | නිසි අධීක්ෂණයකින් යුතුව ඇස්තමේන්තුගත ප්‍රමිතියට වැඩ ඉටු කරවා ගත යුතු වේ. | ආරක්ෂිත බැම්ම සඳහා තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබාගෙන එම වාර්තාවේ මෙහි යෙදූ කොන්ක්‍රීටය නුසුදුසු තත්ත්වයේ පවතීනම් ගෙවීම් කටයුතු නොකරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | කොන්ක්‍රීට් මාර්ග තලයේ දකුණු පස පිහිටි කානුවට ජලය බැසයන ආකාරයෙන් කොන්ක්‍රීට් මාර්ගය බැවුම් වන සේ ඉදිකර ඇතත්, බොහෝ ස්ථානවල ජලය බැස යාමකින් තොරව මාර්ගය තුළ ජලය රැස්වීමේ අවදානම් තත්ත්වයක් ඇතිවී තිබුණි. | නිසි අධීක්ෂණයකින් යුතුව ඇස්තමේන්තුගත ප්‍රමිතියට වැඩ ඉටු කරවා ගත යුතු වේ. | බිල්පත් ගෙවීමට පෙර එම අඩුපාඩු නිවැරදි කරවා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | පොල්වත්ත නව බුදු මැදුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම- රු.1,000,000<br>--------------------------------------- | | |
| (i) | 1:2:4 (19 mm) සිමෙන්ති මිශ්‍රණයක් යොදා ඉදිකළ කොන්ක්‍රීට් මාර්ග තලය කඩා පරීක්ෂා කිරීමේදී අඟලක පමණ ගැඹුරකින් පසුව පහසුවෙන් කැඩී යන මට්ටමේ සිමෙන්ති, වැලි හා ගල් සම්බන්ධ වීමකින් තොරව කොන්ක්‍රීටය දුර්වලව පැවතුණි. | නිසි අධීක්ෂණයකින් යුතුව ඇස්තමේන්තුගත ප්‍රමිතියට වැඩ ඉටු කරවා ගත යුතු වේ. | මෙම කොටස අදාළ සමිතිය මඟින් පිළිසකර කරවා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ii) | කොන්ක්‍රීට් මාර්ග තලයේ දෙපස උරහිස් පුරවා සකස් කර නොතිබීම හේතුවෙන් මාර්ගයේ ගමන්කරන මගීන්ට හා වාහනවලට හානිදායක වීමේ අවදානමක් නිර්මාණය වී පැවතුණි. | වාහනවල හා මගීන්ගේ ආරක්ෂාව තහවුරු කරගත යුතු වේ. | ඉදිරියේදී දෙපස පස් පුරවා සකස්කර වාහන ගමනාගමනයට හා මගීන්ට ඇතිවිය හැකි අවදානම අවම කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-------------------------------------------

### විගණන හා කළමනාකරණ කමිටු
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සිපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය හා 2014 අගෝස්තු 01 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක සිපීසී/සීඑම්සී/1/6 දරන ලිපිය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් කමිටුවක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |